# ලේඛන කලාවේ කස්තිරම් කාරයා ඩී බී කුරුප්පු

**ඩබ් එච් උපසේන**
සභාපති
**ඔස්ට්‍රේලියා වාසී ශ්‍රී ලාංකික ලේඛකයන්ගේ සංසදය**

මෙරටට පැමිණ තුත්තිරි ගස් අල්ලමින් සිටි අවධියේ ඇස ගැසුණු මෙරට පලවන පුවත් පත් වල පලවූ ලිපි වලින් මම ඔහු හඳුනා ගනිමින් සිටියෙමි. ජීවන අරගලය මිස ලේඛන කලාවට නැවත අත පෙවීම ඒ කාලයේ සැබෑම සිහිනයක් විය. එහෙත් ඔහු ලියූ කස්තිරම හා පූරනීතෙ තීරු ලිපි මාලාව නොබලා අහක දැමීමේ බැරි තරමට රසවත් ඒවා විය. ඒවා හරහා මෙරට හා ලංකාවේ ශ්‍රී ලංකික ජන සමාජ වල දුබලතා වලට එල්ල කළ උපහාස හා විවේචන බෙහෙවින් නිර්දය ඒවා විය. කාගේ හෝ පිට කසන්නාවූ විචාර හෝ විමංසා අතරේ ඔහුගේ ලියමන් වෙනස් මගක් ගත්තේය. මට පෙනුන හැටිය ඔහුට රක-න්නට ගුරු කුලයක් හෝ නොවීය.

කාලයාගේ ඇවෑමෙන් විය පත් වන වන විට පවතින සමාජ සම්බන්ධතා කඩ වැටෙන පසුබිමේ වුවද ඔහුගේ ලිය කියමන් වල තියුණු බව අඩු නොවීය. මේවා ඇතැම් අවස්ථාවල රතු ඉර පැන ගියේය. ඒවා ඔහුට වගේ වගක් වුවාදැයි සැක සහිතය. පේරා-දෙණි විශ්ව විද්‍යාලයේ මුල්ම ශිෂ්‍ය කණ්ඩායමේ සිටි ඔහු 1953 පිහිටවූ විශ්ව විද්‍යාල සිංහල සංගමයේ සභාපතිවරයාද විය. දශක හයක් පුරා විහිදුනු ඔහුගේ ලේඛන දිවිය සාහිත්‍ය දේශපාලන හා ආගමික යන හැම ක්ෂෙත්‍රයකම විහිදී තිබුණි ඔහු සිය ලේඛන කලාව අරඹන්නේ අප ඉප-දෙන්නටත් පෙර සිටය. 1950 ගණන් වලත් ඔහු දිනමිණ පුවත් පතට ලිපි සැපයූ බව තිලකරත්න කුරුවිට බණ්ඩාරට ද මතක ඇත. යටගිය මතක සටහන් ගැන කියැවෙන මග හොඳට තිබුනත් " සත්‍ය හා කල්පිතයන් එක් කළ "පිතු හදක ඇත සියුම් හිදැසක්" "එක්තරා ප්‍රේම කතාවක්" වැනි කතා වලදී ස්වීය ජීවන් අත්දැකීම් දෙස වඩාත් අවංකව හා නිර්භයව බැලීමට අගනා උත්සාහයක් ගෙන ඇති බව මගේ හැඟීමයි. මට තව දුරටත් පෙනී ගිය කරුණක් වන්නේ කුරුප්පු ගේ ලේඛන කෞශල්‍යය වඩාත් විහිදා පෑවේ දේශපාලන ලිපි මාලා තුල බවයි. ඔහුගේ ඉලපත බාල්දිය කොස්ස සහ පිරිත් නූල" මෙන්ම "පිරිමි ජාතිය උතුම් ජාතිය" එන ලිපි මාලාවේ මාතෘකා විමසීමේදී එය වඩාත් පැහැදිලි වෙයි. එම ග්‍රන්ථයේ එන බමුණු කුලය බිඳ වැටුනේ නැත- මාක්ස් වාදය සමාජ වාදයමද? - බෞද්ධයන්ගේ ආගමික ශ්‍රද්ධාව - අප වාසය කරන්නේ කළු මිනි සුන්ගේ රටේ - වැනි මාතෘකා ඒවාට උදාහරණ සපයයි ඉතිහාසයේ සිද්ධි මාලාවන්ගෙන් හා සිය මතකය ඇසුරින් ඔහු ගොඩ නගන තර්ක හා මතවාද සම්ප්‍රදායක චින්තකයන්ගේ ආකල්ප හා නිරන්තරයෙන් ගැටෙයි අපට ඉතිහාසය ගැන අලූතින් සිතන්නට කියාදෙයි.

පරිවර්තකයකු වශයෙන් විශ්ව සාහිත්‍යයට එක විය යුතු අගනා ග්‍රන්ථ රැසක් සිංහල පාඨකයාට හඳුන්වා දීමෙන්ද ඔහු අගනා සේවයක් ඉටු කළේය. රුසියානු විප්ලවය පසුබිම් කොට ගෙන ලියවුනු "අර්බත් දරු-වෝ" චීන විප්ලවීය පසුබිම කොටගෙන ලියවුනු "මරකත නෙත" "හිරෝෂිමා දින පොත" ජගත් සාහිත්යය වෙත පිවිසෙන්නට ඇර දෙන කවුළු වැනිය

ඔහු සාහිත්‍යයෙන් ඔබ්බට ගමන් කරමින් සමාජ විශ්ලේශකයකු වශයෙන් ද සිය පෑන අපූරු ලෙස මෙහෙයවීය. සිගරු සිරිත ලියමින් මෙරට ට සංක්‍රමණය වන ශ්‍රී ලාංකි කයින්ගේ ගති පැවතුම් වෙනස් වන අයුරු කදිමට කියා පායි. එමගින් ලේඛකයකු සතු සියුම් නිරීක්ෂණ හැකියාව මැනවින් ප%දර්ශනය කරයි.

"සුමුදු බොදු බවුන් මග" "අන්තර් භවය" වැනි අනුවාදක කෘතීන් මගින් ද ඔහු බුදු දහමේ හරයන් පාඨකයා හා බෙදා ගැනීමට කරන උත්සාහයද පැසසුම් කටයුතුය

මෙහි වසන ජගත් සහ සාමන්ත වැනි ලේඛකයින් හඳුනා ගැනීමට මම භාවිතා කළේ මගේ නිර්මාණයන්ය. අප කතා නායකයා වන කුරුප්පු ශූරීන්ව ද ඒ මාර්ගයෙන්ම හඳුනා ගැනීමට අවස්ථාවක් මට උදා වුයේ ඔහු කලක් ඉසුඹු ලබමින් සිටි සාත්තු නිවාසයේ සිටිද්දීය. මෙහි ලේඛකය-න් අතින් පළවන ග්‍රන්ථ පිලිබඳ ඔහු ලියවුනු විචාර ගැන දැනුවත්ව සිටි මම මගේ කෙටි කතා සංග්‍රහයේ පිටපතක් එහි ඉඳ හිට හෙද සේවයට යන මගේ බිරිඳ හරහා ඔහු අතට පත් කළෙමි. මට මතක හැටියට වසර දෙකකට නොඅඩු කාලයක් පුරා දිවෙන අපේ මිතුරු දම ආරම්භ වුයේ එතැන් සිටය. වෛද්‍ය නොයෙල් නඩේෂන්ගේ සමනල වැව පොත එළි දැක්වීමේදී ද ඉන්පසු හමු වූ වාර කිහිපයකදීම ඔහු මගේ ලේඛන කලාව දිරිමත් කරමින් පිළිසඳරට එක්විය.

උතුරු මෙල්බර්න් නුවර ප්‍රජාශාලාවක පැවැත්වූ ඔහුගේ අවසාන පොත් ප්‍රදර්ශනයට සහභාගී වීමට තරම් මම භාග්‍යයවන්ත වීමි. මේ උළෙල ගැන දැනුම් දෙමින් ජගත් මට කියා සිටියේ මෙය තමන්ගේ අවසන් පොත් දැක්ම විය හැකි බව කුරුප්පු අන්කල් කියා සිටින බැවින් නොවරදවා සහභාගී විය යුතු බවය. ඔහු වේදිකාවට ආවේ දෙදෙනෙකුගේ වාරුවෙනි ඔහු සැබවින්ම දුර්වලව සිටියේය. කතාවේ මුල් භාගයේදී ඔහුගේ කට හඬේ ගැහෙන ස්වරූපයද මම හොඳින් නිරීක්ෂණය කළෙමි. මට එවෙලාවේ නම් සිතට නැගුනේ මෙය ඇත්තටම ඔහුගේ අවසන් දැක්ම විය නොහැකිද යන්නයි .

එහෙත් ඔහු මද වෙලාවකින් සිය කතාවෙන් හතර අතටම නෙලන්නට පටන් ගත්තේය. හැබැයි කතාව අවසානයේදී සිය මරණය ඉඟි කළ බව මට මතකය. තවත් උපන් දිනයක් සමරන්නට හැකි වේද යන්න ගැන ඔහු සැබවින්ම සැක පහල කළේය. ඒවෙලේ ශාලාවේ පසෙක මේස මත අතුරා තිබූ ඔහුගේ පොත් දෙස නිකමට මෙන් බැලූවෙමි. ඇත්තටම "සැන්දෑ තරු එළියේ කිමිදෙන හිරු" යනුවෙන් ඔහු ලියූ පොත මතට ශාලාවේ වීදුරු ජනේලයකින් පෙරී ආ සන්ධ්‍යාවේ මලානික හිරු රැස් පතිත වී තිබුණි.

ඔහු සිය කතාවේදී කළ එක ඉල්ලීමක් ඉටු කිරීමට නම් අපට හැකි විය. එනම් මෙරට වසන ශ්‍රී ලංකාවාසී ලේඛකයින්ගේ සංගමයක් පිහිටුවා ගැනීමයි. අප ඔහු එහි අනුශාසක වශයෙන් පත් කර ගතිමු . එහෙත් සංගමය බහ තෝරන්නට පටන් ගන්නනට පෙරාතුවම දිවි සාරිය නිම කරන්නට ඔහුට සිදු විය. ඉතින් අපගේ සංගමය වෙනුවෙන් අප ඔහුට නිවන් මගම පතමු



**ඔස්ට්‍රේලියා වාසී ශ්‍රී ලාංකික ලේඛකයන්ගේ සංසදය පිහිටවූ දා ඩී බී - සංගමයේ ලේකම දිළිණි රියවල හා සභාපති ඩබ් එච උපසේන සමග**

